චක්‍රලේඛ අංක :- 01/2004

මගේ අංකය:- බප/සසේකො/ලේ/නිර්/20
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2004.03.08.

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත,

**විනය පරීක්ෂණ නිලධාරි මණ්ඩලයක් පත් කිරීම**

බස්නාහිර පළාත් සභාවේ 1994 අංක 01 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 25/3 වගන්තියේ සඳහන් පරිදි 1981.12.01 වන දින අංක 169/8 දරණ ගැසට් පත්‍රයේ පළ කර ඇති රෙගුලාසි මාලාවේ අංක 78, 92, 93 යන රෙගුලාසි ප්‍රකාර බස්නාහිර පළාතේ සමුපකාර සමිතිවල විනය පරීක්ෂණ නිලධාරීන් වශයෙන් කටයුතු කිරීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන් ගේ නාම ලේඛන ඇතුලත් කර 1996 නොවැම්බර් මස 12 වන දින ම විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 7/96, 1999 ජනවාරි මස 07 වන දින නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 3/99 සහ 2001 සැප්තැම්බර් මස 28 වන දින නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 03/2001 කෙරෙහි ඔබේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. එම නාම ලේඛනවල සඳහන් විනය පරීක්ෂණ නිලධාරීන් ගේ නාම ලේඛනයේ අවසානයට මීට අමුණා ඇති අංක 01 දරණ උපලේඛනයේ නම් සඳහන් නැනැත්තන් විනය පරීක්ෂණ නිලධාරීන් වශයෙන් පත් කිරීමට සමුපකාර සේවක කොමිෂන් සභාව තීරණය කර ඇත. ඒ අනුව මින් ඉදිරියට විනය පරීක්ෂණ සඳහා පරීක්ෂණ නිලධාරීන් තෝරා ගැනීමේදී මෙහි සඳහන් නිලධාරීන් ද ඒ සඳහා සලකා බලන ලෙස කොමිෂන් සභාවේ නියමය පරිදි දැන්වීමට කැමැත්තෙමි.

ජේ.කේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. බස්නාහිර පළාතේ සමුපකාර, ක්‍රීඩා හා යොවුන් කටයුතු අමාත්‍ය තුමාගේ සම්බන්ධීකරණ නිලධාරි
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්-සමුපකාර, ක්‍රීඩා හා යොවුන් කටයුතු අමාත්‍යාංශය (බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ )
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියලුම වෘත්තිය සමිති සංගම්